"විශ්වෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම්
பிரதம செயலாளர்
Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 2698409
ෆැක්ස් / தொலை / Fax - 2694667
ඊ-මේල් / மின்னஞ்சல் / Email chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන தொலைபேசி General Telephone 2682868, 2682869, 2682870

මගේ අංකය. எனது இல. My No. CSO/ADM/18/38 (3)-2016
ඔබේ අංකය. உமது இல. Your No.
දිනය. திகதி. Date. 2016.10. 24

පාලන වක්‍රලේඛ ලිපි

සභා ලේකම් (බ.ප.),
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් (බ.ප.);
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන),
ආදායම් කොමසාරිස් (බ.ප),

ආණ්ඩුකාර ලේකම්තුමා හට ලිපි යොමු කිරීමේ දී නිසි ධුරාවලිය අනුව ලිපි යොමු කිරීමට කටයුතු කිරීම.

"ගරු ආණ්ඩුකාරතුමා වෙත ලිපි ඉදිරිපත් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු" යන මැයෙන් යොමු කරන ලද උක්ත සමාංක හා 2016.09.26 දිනැති පාලන වක්‍රලේඛ ලිපියට වැඩිමනක් වශයෙන් ඉදිරිපත් කරමි. එසේම 2016.10.17 දින ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රධාන ලේකම්තුමා සමඟ පැවති සාකච්ඡාවේ දී උක්ත කරුණ පිළිබඳ ව අවධානය යොමු කර ඇත.

02. ඒ අනුව, ආණ්ඩුකාර ලේකම්තුමා හට ලිපි යොමු කිරීමේ දී පහත පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

i. සෘජුවම අමාත්‍යාංශ මඟින් ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරීමට අවසර ලත් ලිපි, අමාත්‍යාංශ ලේකම්වරයා ගේ අත්සනින් හෝ අමාත්‍යාංශ ලේකම්වරයා ගේ නිසි අනුමැතිය ලබා ගෙන අත්/කළේ ලෙස සඳහන් කරමින් අදාළ මාණ්ඩලික නිලධාරීන්ගේ අත්සනින් යුක්තව සහ

ii. ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් යොමු කරනු ලබන ලිපි ප්‍රධාන ලේකම්වරයාගේ අත්සනින් හෝ ප්‍රධාන ලේකම්වරයාගෙන් නිසි අනුමැතිය ලබා ගෙන අත්/කළේ ලෙස සඳහන් කරමින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්/අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) ගේ අත්සනින් යුක්තව යොමු කිරීම.

කේ.කේ. චම්පිකා කනේරු,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)-වැ.බ.
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

පිටපත

01. ආණ්ඩුකාර ලේකම් (බ.ප) - *කරු. දැ. ගැ. ස.*
02. ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් - *කරු. දැ. ගැ. ස.*